කස්තිරම

ඩී බී කුරුප්පු

සැප්තැම්බර් 24 වන දා අරංගේතුම් නැටු හංසිනී පැලෑඳ, නන්දා මාලිනී ගයන යමුනා ගං තෙර ගීතය නටා පෙන්වූවා ය. ඒ කතාව කියා මේ ලිපිය පටන් ගන්නේ නැටුම් ගැන කීමට නොවේ. සපුරා වෙනස් මාතෘකාවකට බහින්නට ය.

ඒ නර්තනයේ සංරචනයට අත ගැසීමට පෙරාතුව නර්තනාචාරිනිය හංසිනී ගේ දෙමාපියන්ට උපදෙස් දුන්නේ එහි දෙමළ පරිවර්තනය ලබා ගන්නා ලෙසට ය. ඇය සිංහල නොදන්නවාට නොවේ. තමාගේ හදවතට සමීප භාෂාවෙන් උකහාගත් කල නිශ්චිත අර්ථයන් භාවයන් වඩා හොඳින් නිරූපනය කළ හැකි නිසා ය. ඒ උපදෙසින් මතුවන එක් කරුණකි. තවත් වැදගත් කරුණක් ද ඇය දුන් උපදෙසින් පෙනී යන්නේ ය. ඇය නිර්දේශ කළේ පරිවර්තනය ශ්‍රී ලංකාවේ සිංහල මහාචාර්යවරයකු ලවා කරවා ගන්නට කියා ය. ඔහු සුනිල් ආරියරත්න ය. එසේ කීවේ ද අපතර වසන දෙමල භාෂා විශාරදයා ගැන ඇය නොදන්නා නිසා නොවේ. සිංහලයාට සිංහල ගීතය වඩා හොඳින් හදවතට පිවිසෙන හින්දා ය. මේ රටේ සිට වුවත් සුනිල් ගැන ඇය දැන සිටි නිසා ය.

අන්තිමට ඒ කාරිය යට කී දෙමළ වියතා වූ මුරුගන් පූජිති විසින් ඉටු කරනු ලැබීම මෙතැනට අදාල නොවේ.

මා මේ මාතෘකාව වෙතට යොමු කරන ලද්දේ ඒ පුවතට වඩා රංගනය අවසානයේ ඒ දැරියන් දෙදෙනා කළ ස්තුති කතාවය. තමන් විසින් මෙහි සිටින අපේ උදවියට පමණක් නොව මව්බිමේ වසන දේශප්‍රේමීන්ටත් වැදගත් ආදර්ශයක් දෙන ලද බව හංසිනී පවා නොදන්නවා ඇත . අන්න ඒ ආදර්ශය තව දුරටත් පැහැදිලි කළ යුතුය.

එක් හැවිරිදි දැරියක ලෙසින් මෙරටට සංක්‍රමණය වූ ඇය මව් බස හොඳින් කතා කරනවා පමණක් නොවේ. තමන්ගේ මව් රටෙන් මෙහි පැමිණි අනෙක් ජන කොටස වූ දෙමළ ජනතාවගේ මව් බසටද ගරු කරමින් එයත් ඉගෙනීමට ද තීරණය කළා ය. ඇය සමග නැටූ ඉන්දියානු දැරිය වාගේම ඇයත් ඉංග්‍රීසි හැරුණ විට සිංහල දෙමළ යන දෙබසින්ම සභාව ඇමතුවා ය.

දෙමළ ගායනයෙන් ඔපවත් ව ඉදිරිපත් වන ඒ සංස්කෘතියේ ප්‍රබල අංගයක් වන භරත නැටුම හරි හැටි හදාරන්නට නම් එය රැකගෙන ආ බසද වටහා ගැනීමේ අගයත් අවශ්‍යතාවත් ඇය විසින් තහවුරු කරන ලදී . වෙනත් විදියකින් කියතොත් ඇය ක්‍රියාවෙන් ඔප්පු කර සිටියේ අනෙක් අයගේ හදවතට සමීප වීමේ හොඳම මග ඔවුන්ගේ හද බැඳගත් බස ඔස්සේ වැටී ඇති බව ය.

මම මේ යථාර්ථය ඔස්සේ බොහෝ දුර සිත මෙහෙයවීමි. එසේ කළ යුතු වූයේ අප මව් බිමේ අද පවත්නා ගැටලු බොහොමයකට මුල යට කී යථාර්ථය වටහා නොගැනීමේ ආදීනව වශයෙන් උද්ගතව ඇති බව පෙනී යන නිසා ය.

මෑත අතීතයෙන් පටන් ගනිමි. ඒ මෙල්බර්න් පුරවරයේ මය. ගිය නොවැම්බරයේ දිනක ඩැංඩිනොං ශාලාවක මිත්‍රත්ව රාත්‍රි භෝජනයක් පවත්වන ලද්දේ ශ්‍රී ලංකාවේ නව වානාවරණය අනුව මෙරට වාසය කරන ශ්‍රී ලාංකික ජන කොටස් අතර සුහදතාව හා සමගිය වැඩි දියුණු කරන අටියෙනි. එදා සිංහලයන් තරමටම - වැඩියෙන් යයි කියන්නටත් පුළුවන - දෙමළ ගැහැනු පිරිමි දෙගොල්ලන්ම රාත්‍රි භෝජනයට සහභාගි වූහ. සිංහල හා දෙමළ දැරියෝ ජාතික නැටුම් ඉදිරිපත් කළහ. අවසානයට නොයෙල් නඩිසන් ඉංග්‍රීසියෙන් කතා කළ පසු බන්දු දිසානායක සිංහල ඉංග්‍රීසි දෙබසින්ම කතා කළේ ය. දෙන්නාම සංවිධායකයෝ ය. මුරුගන් පූජිති නමැති ලේඛකයා හොඳ සිංහලෙන් වියත් දේශනයක් කළේ ය. දෙමළ කතා කළ හැකි එකද සිංහලයෙක් නැත. දෙමළ වචන කීපයක් වත් කතා කළ අනෙක් තැනැත්තා සිඩිනි නුවර සිට පැමිණ විකට රංගනයක් ඉදිරිපත් කළ බර්ගර් ජාතික කාල් මැකින්ටයර් ය.

අර කියපු සහයෝගය - සුහදතාව තහවුරු කරන්නට තව දුරක් යා යුතු බව මට එදාත් යාන්තමට වැටහුණි.

පූජිති දෙමළ ලේඛකයෙකි. සිංහල බසින් පොත් කිහිපයක් දෙමළට පරිවර්තනය කළ කෙනෙකි. ඔහු ගැන සිතත්ම මගේ සිත දිව ගියේ අඩ සියවසකට පෙර මා සමග සරසවියේ උගත් ගිස්සැල්ලේ ධම්මරතන හාමුදුරුවන් වෙතටය. නියම උච්ඡාරණයෙන් යුතුව හොඳ දෙමළ කතා කළ උන්වහන්සේ -සිංහලයේ දිවිඩ බලපෑම්" ආදී පොත් ගණනාවක් රචනා කළහ. දෙමළ කාව්‍ය ග්‍රන්ථ කිහිපයක් සිංහලට පරිවර්තනය කළ හ. තවත් දෙමළ උගත් සිංහලයෙක් පසුව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේදී මා සමග වැඩ කළේ ය. ශ්‍රී ලංකා ඉතිහාසයේ දෙමළ පර්වර්තන අධිකාරි තනතුරට පත් එකම සිංහලයා වූ විශ්වනාත් වපිරසේන ඒ පුද්ගලයා ය. අගමෙති ප්‍රේමදාසගේ සිංහල කතා ඔහුගේ නිල පරිවර්තකයා අතින් දෙමළට නැගුණු පසු ඒවා ඔප මට්ටම් කිරීම බාර කරන ලද්දේ වපිරසේනට ය.

සංහිඳියාවේ සැබෑ පදනම

කලක් ලංකා සාහිත්‍ය අනුමණ්ඩලයේ ලේකම් ධුරය දැරූ කේ පී අමරදාස හොඳින් දෙමළ දත් බව හා දෙමළෙන් පොත පත ලියූ බවත් මා දැන ගත්තේ කලක් ගතවූ පසු ය. පුවත්පත් කලාවේදියකු වූ කේ එස් සිවකුමාරන් විසින් පළ කරන ලද දෙමළ කෙටිකතා වල සිංහල පරිවර්තනයක් මට කියවන්නට ලැබුණේය. ජාතිවාදී කෝලාහල කාලයේ අනුවේදනීය පුවත් කිහිපයක් ඒ කතා වලින් නිරූපණය විය.

සිංහල භාෂා සටනේ පුරෝගාමීන් වශයෙන් සඳහන් කළ හැකි දෙදෙනෙක් දෙයාකාරයකින් දෙමළ බසට සේවය කළ ආකාරය මට මතක් වෙයි. එදා රොස්මීඩ් පෙදෙසේ විරෝධතා ව්‍යාපාරයට හවුල් වූ බද්දේගම විමලවංශ හාමුදුරුවෝ දෙමළ බස ප්‍රගුණ කළ පඩිවරයෙකි. -බාලබෝදිනී" නමින් සිංහලෙන් දෙමළ උගන්වන පොත් පෙළක් සම්පාදනය කළ උන්වහන්සේ කලක් මරදානේ ශ්‍රී ලංකා විද්‍යාලයේ දෙමළ පන්තියක් පැවැත්වූ බව මා සිහිපත් කරන්නේ සාතිශය සංවේගයෙනි. ඒ පන්තියට ටික දවසක් ගිහින් මග හැරීම ගැන මම අදත් මට දොස් කියා ගනිමි.

එල් එච් මෙත්තානන්ද අනෙක් පුද්ගලයා ය. ආනන්ද විද්‍යාලයේ මැදි පාසලේ දරුවන්ට දෙමළ ඉගැන්වීම සඳහා දෙමළ ගුරුවරයන් බඳවා ගත් ඔහු විසින් ඒ කටයුත්ත අත්හිටුවා දමන ලද්දේ නව සිංහල උද්‍යොගය නොහොත් වියරුව නිසා යයි සිතමි.

හැට ගණන් වල කන්කසන්තුරේ සිමෙන්ති කම්හලට ගිය මම නවාතැන් ගත්තේ හිලදරු නිවස්නයේ ය. බැලූ බැල්මට දෙමළ යයි සිතිය හැකි බාරකාරයාට මා කතා කළේ ඉංගිරිසියෙනි. සිංහලෙන් කතා කරන්නයි ඔහු මගෙන් ඉල්ලුවේද ඉංගිරිසියෙනි. දෙමළ කාන්තාවක විවාහ කරගත් ඔහු දෙමළ කතා කළේ ද හුරුපුරුදු විදියට ය.

ශ්‍රීලනිප යේ ප්‍රබලයෝ දෙදෙනෙක් මගේ සිහියට නැගෙන්නෝ ය. මෛත්‍රිපාල සේනානායක සහ කේ බී රත්නායක දෙනොම යාපනයේ උගත් නිසා හොඳින් දෙමළ දැන සිටිය හ.

මා මේ අතීතය මතක් කරන්නේ දෙමළ හදවතට සමීප වන්නට - දෙමළ ජනතාව සමග හදවතින්ම බැඳෙන්නට හැකියාවක් තිබුණු මේ විදියේ සිංහලයන් විසින් ඉටු කරන ලද ජාතික මෙහෙවරින් අප දේශයට වැඩක් නොවූනේද යන ප්‍රශ්නය මතු කරනු පිණිස ය.

වාසුදේව නානායක්කාර ඇමත.වරයා යටතේ ත්‍රෛභාෂික ව්‍යාපාරයක් දියත් කර ඇති බව කියැවෙයි. එය අනාගතයට සුබ ලකුණක් බවත් පෙනෙයි. එහෙම වුණත් වාසුදේව පවා තවමත් දෙමළ කතා කරන තැනට එළඹ නැත .

ඒ අතරවාරයේ වෙනම රාජ්‍යයක් ඉල්ලන අන්තවාදීන් වශයෙන් හැඳින්විය හැකි දෙමළ දේශපාලකයෝ අපේ උදවියට වඩා සාර්ථක විදියට සිංහලයාට සමීප වන්නට පමණක් නොව සිංහලයා ගණන් ගන්නටත් පුරුදු වූ බව ආර් සම්බන්දන් හෝ අන් කවර දෙමළ නායකයකු වුවත් සිංහලෙන් කතා කරන විට පැහැදිලි වන්නේය.

සමහර විට මා මේ පරතරය නොහොත් මදිපාඩුව (නොකතා හැරීම) අධිතක්සේරුවකින් සලකනවාද විය හැකි ය. එසේ වුව ද මා අවධාරණය කරන්නේ සිංහල දෙමළ දෙපිරිස අතර සමීපතාව හදවතට දැනෙන ආකාරයට ඇති වීම මෙතරම් කල් ගියේ එක් පිරිසක් අනෙකාට තේරෙන භාෂාවෙන් කතා කිරීමට පසුබට වීම නිසා බව ය. එයට හොඳම නිදසුනක් එස් පියසේන ලියූ -කළු ජූලියේ රිදී පුබ්ලිය" නම් පොතේ සඳහන් වූ මඩකලපුවේ නව නගරාධිපතිනිය ශිවගීතා ප්‍රභාකරන් විදේශ සිංහල ගුවන් විදුලි සේවයකින් ඇසූ ප්‍රශ්න වලට සිංහලෙන්ම පිළිතුරු දීම ය.

තුස්ත පරාජයෙන් පසු ඔය හපන්කම කරන්නට සමත් වූ සිංහලයන් සිටින්නේ දෙනෙකු පමණි. පළමුවැන්නා ජනාධිපති මහින්ද රාජපක්ෂ ය. දෙවැන්නා ශ්‍රී ලංකාවේ අධිකරණ නායිකා ශිරානි බණ්ඩාරනායක ය. උතුරේ නව අධිකරණ සංකීර්ණයක් විවෘත කිරීමට ගිය ඇය එහි ජනතාව අමතා දෙමළෙන් කතා කිරීමද අනාගතයට සුබ ලකුණක්ම ය. රාජ්‍ය නායකයාත් අධිකරණ නායිකාවත් රටට දුන් ආදර්ශය දැන්වත් රට ගැන හඬ නගන දේශපාලකයන් තේරුම් ගතහොත් ඒ අනාගත සුබ ලකුණු පල දරනවාද ඇත .

warna
LEGAL
Justice for all...

Family Law
Business Law & Commercial Law
Conveyancing
Migration Law
Powers of Attorney & Wills
Australian/Sri Lankan Legal Advises

FIRST CONSULTATION FREE

Madhu Warnakulasuriya LL.B.
Barrister & Solicitor
29 Tristania Street, Doveton VIC 3177
Tel: 03 9713 1118 Fax: 03 9713 1118
Skype: warnalegal
Email: warnalegal@gmail.com

MARN: 1068979

Call 0432 480133